**ශීර්ෂය 54 - කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුලි 06 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ (2)11 වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 දෙසැම්බර් දින 31ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී . ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කල එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක හා සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ  දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතාකරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරවු කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුලත් වී ඇති බව සහ හෙළිදරවු කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූල්‍ය තත්ව ප්‍රකාශයේ දක්වා තිබූ මූල්‍ය නොවන වත්කම් හා භාණ්ඩාගාර සටහන් අනුව අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් අතර රු.202,241,262 ක වෙනසක් නිරීක්ෂණය විය. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ මගපෙන්වීම්වලට අනුකූලව සහ භාණ්ඩාගාර ගිණුම්වලට අනුකූල වන පරිදි හැකිතාක් නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිලියෙල කළ යුතු වීම. | අමාත්‍යාංශය 2019 වර්ෂයේදී මෙහෙවර පියස ගොඩනැගිල්ල වෙත මාරු කිරීමේදී අමාත්‍යාංශයේ පැරණි අපහරණයන්වල වටිනාකම් හා කම්කරු දෙපාර්තමේන්තුවට කරන ලද පැවරීම්වල වටිනාකම් පොත්වලින් ඉවත් කරන ලද අතර, නව ගොඩනැගිල්ලේ වත්කම්වල අගයයන් සිගාස් පරිගණක වැඩසටහනට ඇතුලත් කරන ලදී. මූල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇති වත්කම්වල අගයන් නිවැරදි වන අතර ඉදිරියේදී භාණ්ඩාගාර සටහන්වල වෙනස්කම් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ වත්කම් යටතේ භාණ්ඩාගාර ප්‍රකාශ අනුව මුදල් හා මුදල් සමාන දෑ රු.218,772 ක් දක්වා නොතිබුණි. තවද, 2019 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ ශුද්ධ වත්කම්වල වටිනාකම රු.218,772 ක් අඩුවෙන් දක්වා තිබුණි. | - එම - | ඒසීඒ - 3 ආකෘතිය පරිදි රු.218,773/- ක් වූ නොපිය වූ උප අග්‍රිම ශේෂය ගිණුම් ප්‍රකාශනවල දක්වා ඇත. මෙම මුදල මැතිවරණ කොමසාරිස් කාර්යාලය වෙත ලබාදුන් අතුරු අග්‍රිම වේ. එබැවින් එය මූල්‍ය තත්ත්වය පිලිබඳ ප්‍රකාශයේ වගකීමක් ලෙස පෙන්වා දී ඇත. |

### 1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 දෙසැම්බර් 31 දිනට නොපියවූ අග්‍රිම ශේෂය වූ රු.218,772 ක වටිනාකම පිළිබිඹු වන සේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ මගපෙන්වීම්වලට අනුකූලව සහ භාණ්ඩාගාර ගිණුම්වලට අනුකූල වන පරිදි හැකිතාක් නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. | මැතිවරණ රාජකාරි වෙනුවෙන් ගෙවීම්වලට අදාල නොපියවූ අත්තිකාරම් ශේෂය වූ රු.218,773 ක මුදල සඳහා වූ චෙක්පත 2020.01.23 වෙනි දින අමාත්‍යාංශය වෙත ලැබී ඇත. එබැවින් 2019 දෙසැම්බර් 31 දිනට නොපියවූ අත්තිකාරම් ශේෂය ලෙස පෙන්නුම් කිරීමේ හැකියාවක් නොමැති බව පෙන්වාදීමට කැමැත්තෙමි. |

### 1.6.3 අත්තිකාරම් ගිණුම් ශේෂ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අමාත්‍යාංශය විසින් 2019 වර්ෂය සඳහා අංක 05401 දරන අත්තිකාරම් බී ගිණුම භාණ්ඩාගාරය විසින් නිකුත් කල අවසන් පරිගණක මුද්‍රිතයේ සඳහන් සංඛ්‍යා සමඟ එකඟ නොවන බව නිරීක්ෂණය විය. ඒ අනුව හර සටහන් යටතේ මුදලින් දරන ලද වියදම් (11) රු.3,000,173 ක් භාණ්ඩාගාරයට වඩා අඩුවෙන්ද හරස් සටහන් ගෙවීම් (12) යටතේ රු.3,210,242 ක් වැඩියෙන්ද ගෙවා තිබුණි. එසේම බැර සටහන් යටතේ ලැබීම්වලට අදාලව මුදලින් ලද වටිනාකම රු.960,156 ක් භාණ්ඩාගාරයට වඩා අඩුවෙන්ද හරස් සටහන් මගින් ලැබීම් (12) යටතේ රු.1,170,256 ක් වැඩියෙන්ද දක්වා තිබුණි. මෙම වෙනස්කම් සඳහා හේතු අනාවරනය නොවුනි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ මගපෙන්වීම්වලට අනුකූලව සහ භාණ්ඩාගාර ගිණුම්වලට අනුකූල වන පරිදි හැකිතාක් නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. | අමාත්‍යාංශය විසින් 2019 වර්ෂය සඳහා අංක 05401 දරන අත්තිකාරම් 'බී' ගිණුම භාණ්ඩාගාරය විසින් නිකුත් කල අවසන් පරිගණක මුද්‍රිතය පදනම් කරගෙන සකස්කර නොතිබුණු බව සඳහන් කර ඇතත්, 2019 වර්ෂයේ මුල් භාගයේ පැවති 19301 හා අග භාගයේ පැවති 05401 සඳහා වූ පරිගණක මුද්‍රිත මාස 12 වම අදාලව පිළියෙල කර තිබූ බව පෙන්නුම් කර දී ඇත. තවද එහිදී 193 ශීර්ෂයට අදාල මුදලින් ගෙවීම් හා ලැබීම් 54 ශීර්ෂයට භාණ්ඩාගාරය විසින් මාරු කිරීමේදී (11) හරහා නොව හරස් සටහන් ලෙස (12) මගින් සිදුකර තිබීම මේ සඳහා හේතු වී තිබුණි. |

**1.6.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදුකල යුතු සහතිකවීම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන අනුව කම්කරු හා වෘත්තීය සිමිති සබඳතා අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වීම. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර එහි සඵලදායීතාවය පිළිබඳ කලින් කල සමාලෝචනය ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 අග්‍රිම කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මු.රෙ. 371(5) ප්‍රකාරව සියලුම අතුරු අග්‍රිම අදාල වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පියවිය යුතු වුවද 2019 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර ප්‍රකාශය අනුව නොපියවන ලද අග්‍රිම ශේෂය රු.218,773 ක් විය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අතුරු අග්‍රිම වර්ෂ අවසානයට ප්‍රථම පියවීමට කටයුතු කලයුතු වීම. | මෙම අග්‍රිම ශේෂය මැතිවරණ කොමසාරිස් දෙපාර්තමේන්තුවෙන් නිරවුල් කරගත යුතු වූ අතුරු අග්‍රිම ශේෂය වේ. |

## 2.2 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාග්ධන වැය විෂයයන් 12 ක් සඳහා වෙන් කර තිබූ රු.28,250,000 ක ප්‍රතිපාදනයෙන් රු.22,445,260 ක් ඉතිරි කර තිබුණි. එය සියයට 49 සිට සියයට 100 දක්වා වූ පරාසයක විය. තවද, පුනරාවර්ථන වැය විෂයන් 11 ක් සඳහා වෙන්කර තිබූ රු.24,301,955 ක ප්‍රතිපාදනයෙන් රු.8,196,821 ක මුදලක් ඉතිරි කර තිබුණි. එම ඉතිරි කිරීම් සියයට 31 සිට සියයට 89 දක්වා පරාසයක් තුල විය. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු හැකිතාක් තාර්කික පදනමකින් හා නිවැරදිව පිළියෙල කිරීමට අමාත්‍යාංශය කටයුතු කලයුතු වීම. | ප්‍රාග්ධන වැය විෂයන්වල ප්‍රතිපාදන ඉතිරිවීමට හේතුවී තිබුණේ 2019.04.08 දිනැති අංක 03/2019 හා 05/2019 දරන 2019 සැප්තැම්බර් 29 දිනැති ජාතික අයවැය චක්‍රලේඛය අනුව ඉතිරි කිරීම් සිදුකිරීම වේ.<br>මීට අමතරව භාණ්ඩාගාරයෙන් අක්මුදල් නොලැබීම හා සමහර වැය විෂයයන්වල වියදම් කළමනාකරණය කර ගැනීම් ප්‍රතිපාදන ඉතිරියට හේතු වී ඇත. |

## 2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

<table>
<tr><th colspan="2">විගණන නිරීක්ෂණය</th><th>නිර්දේශය</th><th>ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම</th></tr>
<tr><td>(අ)</td><td>2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයෙහි 3.4 ඡේදය ප්‍රකාරව බැදීම් හා බැරකම් ප්‍රකාශය මගින් වාර්තා නොකල කිසිදු බැදීමක් හෝ බැරකමක් පෙර වර්ෂයේ වියදමක් ලෙස 2020 වර්ෂයේදී නිරවුල් නොකල යුතුය. මූල්‍ය ප්‍රකාශනයේ හා භාණ්ඩාගාර සටහන්හි සඳහන් නොවන අවස්ථා 2 කට අදාල බැරකම් වටිනාකම රු.258,627 ක් විගණනයේදී නිරීක්ෂණය විය.</td><td>අමාත්‍යාංශය විසින් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම පියවීමට ඇති බැරකම්වල නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල නිරූපණය කලයුතු බව</td><td>පහත සඳහන් බැරකම් හැර අනෙකුත් සියලුම බැරකම්, බැරකම් ලේඛනයේ මෙන්ම මූල්‍ය ප්‍රකාශනයේ හා භාණ්ඩාගාර සටහන්හිද පැහැදිලිව අප විසින් පෙන්නුම් කර දී ඇත.
<table>
<tr><th>වැය විෂය</th><th>ආයතනයේ නම</th><th>වටිනාකම (රු.)</th></tr>
<tr><td>054-1-2-1001</td><td>සභාපති, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය</td><td>224,910.76</td></tr>
<tr><td>054-1-2-1003</td><td>සභාපති, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය</td><td>33,716.12</td></tr>
</table>
ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් ඉහත කී මුදල ජේ.සී.එච්.ජයසිංහ මියට 2019</td></tr>
</table>

| | | |
|---|---|---|
| | | වර්ෂයේදී ගෙවා ඇත. අප අමාත්‍යාංශය විසින් එම මුදල් ප්‍රතිපූර්ණය කිරීමක් පමණක් සිදුකරනු ලබයි. භාණ්ඩාගාරය විසින් වරින්වර අමාත්‍යාංශය වෙත ලබාදෙන අක්මුදල් ප්‍රමාණවත් නොවීමේ හේතුවෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරියට ප්‍රතිපූර්ණය කිරීම පසුව සිදුකර ඇත. |
| (ආ) මූල්‍ය ප්‍රකාශයේ බැදීම් හා බැරකම් යටතේ දක්වා ඇති එහෙත් බැරකම් ලේඛනයේ සටහන් කර නොමැති, අවස්ථා 7 කට අදාල බැරකම් වටිනාකම රු.651,648 ක් විය. | - එම - | අවස්ථා 7 කට අදාල රු.651,648 ක මුදල අමාත්‍යාංශයට අදාල වන අතර එම අවස්ථා බැරකම් ලේඛනයේ ඇතුලත් කිරීමට අතපසු වී ඇතත්, නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත. |

**2.4** **තැන්පත් ශේෂයන්**

**--------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| **----------------------** | **-----------** | **-------------------------------------** |
| (අ) සේවයේ නියුක්තව සිටියදී සේවකයින්ට වන මාරක නොවන හා මාරක අනතුරු හේතුවෙන් සේවායෝජක ආයතන වෙතින් වන්දි කොමසාරිස් කාර්යාලය අයකර ගත් වන්දි මුදල්වලින් 2019 ඔක්තෝම්බර් 31 වන විට රු.8,451,277 ක් නිරවුල් නොකර පැවතුණි. සේවකයින් හා ඔවුන්ගේ යැපෙන්නන්ගේ නිවැරදි තොරතුරු නොමැති වීම, ප්‍රතිලාභීන්ගේ වන්දි මුදල් ගෙවීමට අදාල ලියකියවිලිවල අඩුපාඩු හා ඒවා කාර්යාලය වෙත ඉදිරිපත් නොකිරීම යනාදී හේතු නිසා මෙම වන්දි මුදල් ගෙවීමට නොහැකිව පැවතුණු අතර එහි ප්‍රමාද කාලය මාස 02 සිට වර්ෂ 03 දක්වා කාල පරාසයක් ගෙන තිබුණි. | හදිසි අනතුරුවලින් අනතුරට පත්වන හා මියයන සේවා නියුක්තිකයන්ගෙන් යැපෙන්නන් සඳහා කඩිනමින් සහන ලැබෙන පරිදි කටයුතු කලයුතු වීම. | අනතුරකින් මියයනු ලබන සේවකයන්ට හිමිවන වන්දිය වන්දි ආඥා පනතේ විධිවිධානට යටත්ව උසාවි පරීක්ෂණයක් මගින් අදාල හිමිකරුවන්ට බෙදාදීම සඳහා නියෝග ලැබුණු පසු එම හිමිකරුවන්ගේ බැංකු ගිණුමට අදාල තොරතුරු ගෙන්වා ගෙන එම ගිණුමට බැර කරනු ලබයි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2019 දෙසැම්බර් 31 දිනට වන්දි මුදල් නොගෙවීම නිසා උසාවි 11 කට අදාලව නඩු 51 ක් වරෙන්තු කර පැවතුණි. තවද, අනතුර වාර්තා වී අවුරුදු 11 ත් අවුරුදු 21 ත් අතර කාල පරාසයක් ගතව තිබූ නමුත් අයකරගෙන නොතිබූ මුදල රු.2,326,741 ක් විය. | - එම - | කම්කරු වන්දි උසාවියේ තීන්දුව ප්‍රකාරව දින 30 ක් ඇතුලත වන්දි මුදල නොගෙවන්නේ නම් සේවායෝජකයාගේ චංචල දේපල තහනමට ගෙන වෙන්දේසි කර එම මුදල අයකර ගැනීම සඳහා සේවායෝජක පදිංචි ප්‍රදේශයට අයත් මහේස්ත්‍රාත් උසාවියේ රෙජිස්ටාර් වෙත වරෙන්තුවක් නිකුත් කරනු ලබයි.<br>සිවිල් අධිකරණ ක්‍රියාමාර්ග අනුව එම වරෙන්තුව ක්‍රියාත්මක කර ගැනීමේ වගකීම ඇත්තේ සේවක පාර්ශවයට වන අතර මේ සම්බන්ධයෙන් අප සෑම අවස්ථාවකම ඔවුන් දැනුවත් කලද ඔවුන් ඒ සඳහා ඉදිරිපත් නොවීම මත එම වරෙන්තු ක්‍රියාත්මක කර ගැනීමට නොහැකි වී ඇත. |
| (ඇ) | වන්දි කොමසාරිස් කාර්යාලය වෙත වන්දි මුදල් තැන්පත් කලද නියම යැපෙන්නන් සොයා ගැනීමට නොහැකිවීම නිසා වන්දි මුදල් බෙදා නොදී ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ කම්කරු වන්දි කොමසාරිස් නමින් වෙන් වෙන් වශයෙන් ගිණුම් 6 ක් පවත්වා තිබූ අතර 2019 දෙසැම්බර් 31 දිනට ඒවායෙහි තැන්පත් කර තිබූ මුදල රු.1,892,127 ක් විය. | - එම - | දීර්ඝ කාලයක් වන්දි ලාභීන් එම මුදල් ලබා නොගැනීම මත ඔවුන්ගේ වන්දි මුදල ප්‍රතිලාභයක් අත්කර දීමේ අරමුණින් කම්කරු වන්දි කොමසාරිස් නමින් ඉතිරි කිරීමේ ගිණුමක එම මුදල් තැන්පත් කරන අතර ආපසු ගෙවීමේදී එහි පොලිය ද සමඟ වන්දිලාභීන් වෙත ගෙවීමට කටයුතු කරනු ලබයි. |
| (ඈ) | රැකියාවේ නියුතුව සිටියදී සිදුවූ මාරක අනතුරු හේතුවෙන් මියගිය සේවකයින්ගේ බාලවයස්කරුවන්ට හිමි වූ වන්දි වයස් පූර්ණත්වයට පත් වූ පසු ඔවුන් වෙත ලබාදීම සිදුකල යුතු වුවද වයස් පූර්ණත්වයට පත්ව ප්‍රතිලාභ නිදහස් නොකරන ලද ගිණුම් 392 ක පැවති වන්දි මුදල රු.10,388,836 ක් වී තිබුණි. | - එම - | ගිණුම් ආරම්භකර වර්ෂ 40 ක් 50 ක් ගතවී තිබීම, ලිපිනයන් වෙනස් වීම, ගිණුම් අයිතිකරුවන් විදේශ ගතවී සිටීම, සමහර ගිණුම් හිමියන් මියගොස් සිටීම ආදී හේතු නිසා ප්‍රතිලාභ නිදහස් කල නොහැකිව පැවතුණි. |

## 2.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිලිබඳ සැසඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2019 දෙසැම්බර් 31 දිනට සේවය අතහැර ගොස් වසර 5 කට වැඩි කාලයක් ඉක්ම ගොස් තිබූ කලමණාකාර සහකාර නිලධාරිනියකගෙන් අයකර ගත යුතු රු.138,501 ක් අයකර ගැනීම සඳහා ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.4.1 වගන්තියේ දැක්වෙන පරිදි අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි. | වර්තමාන ණයශේෂ අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කිරීම හා පැරණි ණයශේෂ අයකර ගැනීමට අවශ්‍ය සියලු පියවර ගැනීම. | නීතිපති දෙපාර්තමේන්තුව මගින් යොමුකරන ලද C/DC/111/2018(LS) හා 2020.01.31 දිනැති ලිපියට පිලිතුරු වශයෙන් ML/AD/02/06/III හා 2020.02.12 දිනැති ලිපිය යොමු කර ඇත. |
| (ආ) ස්ථාන මාරුවී ගිය නිලධාරියකුගෙන් අයකරගත යුතු වූ රු.114,575 ක් අයකර ගැනීමට 2020 ජුනි 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | - එම - | එම නිලධාරියා සේවය අතහැර ගියා සේ සැලකෙන බව රත්මලාන ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් දන්වා එවා ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ලබාගත් කම්කරු අමාත්‍යාංශයේ ලේකම් නමින් ලියාපදිංචි කර ඇති වාහන ලැයිස්තුවේ පැවති වාහන 09 ක් දැනට අමාත්‍යාංශය සතුව නොපැවතුණි. | අමාත්‍යාංශය නමින් ලියාපදිංචි රථවාහන වල භෞතික පැවැත්ම හා ඒවායේ වර්තමාන භාවිතය පිළිබඳ යාවත්කාලීන තොරතුරු පවත්වාගතයුතු වීම. | මෙම වාහන සම්බන්ධව පැරණි ගොනු සොයා එම කරුණු පිළිබඳව මේ වන විට පරීක්ෂා කරමින් පවතී. |